ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2016 අගෝස්තු මස 9 වැනි දින |

## 2016 මැයි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

වෙළඳ හිඟය පුළුල් වීම, සංචාරක ඉපැයුම් අඛණ්ඩව වර්ධනය වීම සහ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වීම සමඟ 2016 මැයි මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. පසුගිය වසරේ මැයි මාසයට සාපේක්ෂව ආනයන වියදම සුළු වශයෙන් වර්ධනය වූ අතර තේ, රබර් නිෂ්පාදන සහ රෙදිපිළි සහ ඇඟලුම් අපනයන්හි මන්දගාමී ක්‍රියාකාරිත්වය හමුවේ අපනයන ඉපැයුම් අඩු වීම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් විය. කෙසේ නමුත්, සමුච්චිත පදනම මත 2016 මැයි මාසය අග වනවිට වෙළඳ හිඟය ඉහළ යැමෙන් වූ බලපෑම සංචාරක සේවා මත වූ අඛණ්ඩ ඉපැයීම්, වර්ධනය වූ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ මූල්‍ය ගිණුම වෙත වූ මධ්‍යස්ථ ලැබීම් ප්‍රමාණය සමඟ තරමක් දුරට සමනය විය.

### අපනයන ක්‍රියාකාරිත්වය

සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්ගේ අඩු වීමක් පිළිබිඹු කරමින් 2016 මැයි මාසයේ දී අපනයන ආදායම, 2015 මැයි මාසයේ පැවැති එ.ජ. ඩොලර් මිලියන 883 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 776 ක් දක්වා සියයට 12.0 කින් අඩු විය. තේ, රබර් නිෂ්පාදිත, රෙදිපිළි හා ඇඟලුම් අපනයනවල මන්දගාමී ක්‍රියාකාරිත්වය සමස්ත අපනයන ආදායමේ අඩු වීමට ප්‍රධාන ලෙස දායක විය. තේ අපනයනවල සාමාන්‍ය මිල සහ අපනයන පරිමාව යන දෙකෙහිම අඩු වීමක් පිළිබිඹු කරමින් 2016 මැයි මාසයේ දී තේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණි. තේ සඳහා මැදපෙරදිග රටවලින් සහ රුසියාවෙන් පැවැති අඩු

ඉල්ලුම හේතුවෙන් තේ අපනයනවල සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 4.24 ක් දක්වා සියයට 5.3 කින් අඩු වූ අතර, අපනයන පරිමාව ද කිලෝග්‍රෑම් මිලියන 21.26 ක් දක්වා සියයට 23.0 කින් අඩු විය. විශේෂයෙන්ම රබර් ටයර්, ශල්‍ය හා අනෙකුත් අත්වැසුම් ඇතුළු සියලු උප කාණ්ඩයන්ගේ අපනයනවල අඩුවීම් පෙන්නුම් කරමින් රබර් නිෂ්පාදිත අපනයන ආදායම මෙම මාසයේ දී අඩු විය. සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ යන දෙකටම සිදු කළ ඇඟලුම් අපනයනයේ අඩුවීමක් පිළිබිඹු කරමින්, පසුගිය මාස කිහිපයේ දී යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන නිෂ්පාදිතය වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම ද 2016 මැයි මාසයේ දී අඩු විය. කෙසේ වුවද, 2015 මැයි මාසය සමඟ සැසඳීමේ දී, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ප්ලාස්ටික් හා ඒ සම්බන්ධ භාණ්ඩ, ප්‍රවාහන උපකරණ, රබර් සහ සකස් නොකළ දුම්කොළ ආදියෙහි අපනයන ආදායම 2016 මැයි මාසයේ දී යම් වර්ධනයක් පෙන්වීය.

2016 වසරේ පළමු මාස පහ තුළ දී සමුච්චිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,211 ක් දක්වා සියයට 6.0 කින් අඩු වූ අතර, ප්‍රවාහන උපකරණ, ඛනිජතෙල් නිෂ්පාදිත, තේ සහ කුළුබඩු අපනයන ආදායම් අඩු වීම මේ සඳහා විශාල වශයෙන් හේතු විය. 2016 වසරේ පළමු මාස පහ තුළ දී ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ප්‍රධාන වෙළඳපොළවල් වූ අතර, ඒ සඳහා සිදු කළ අපනයන මුළු අපනයනවලින් සියයට 54 ක් පමණ විය.

### සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2015 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2016 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | 661.3 | 604.2 | (8.6) | 3,440.5 | 3,302.7 | (4.0) |
| රබර් නිෂ්පාදිත | 76.2 | 57.1 | (25.1) | 332.5 | 308.7 | (7.1) |
| රෙදිපිළි හා ඇඟලුම් | 392.9 | 374.7 | (4.6) | 1,981.0 | 2,084.5 | 5.2 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 25.2 | 16.9 | (33.2) | 175.8 | 109.2 | (37.9) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 5.7 | 1.5 | (73.0) | 17.4 | 8.1 | (53.6) |
| මූල ලෝහ හා මූල ලෝහ නිෂ්පාදිත | 5.5 | 5.4 | (3.5) | 25.8 | 29.2 | 13.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 4.8 | 5.4 | 11.4 | 26.6 | 29.2 | 10.0 |
| ප්‍රවාහන උපකරණ | 6.4 | 7.0 | 10.1 | 178.0 | 59.5 | (66.5) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.6 | 27.7 | 12.9 | 156.4 | 126.5 | (19.1) |
| වෙනත් | 119.9 | 108.5 | (9.5) | 547.1 | 547.8 | 0.1 |
| **2. කෘෂිකාර්මික අපනයන** | 217.0 | 168.7 | (22.2) | 1,018.0 | 890.5 | (12.5) |
| තේ | 123.6 | 90.2 | (27.1) | 561.0 | 496.5 | (11.5) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 16.0 | 10.8 | (32.8) | 71.5 | 46.9 | (34.5) |
| පොල් | 32.9 | 27.9 | (15.0) | 142.3 | 142.7 | 0.3 |
| මුහුදු ආහාර | 14.9 | 12.6 | (15.3) | 72.3 | 70.5 | (2.5) |
| කුළුබඩු | 21.4 | 19.4 | (9.0) | 130.8 | 93.4 | (28.6) |
| රබර් | 2.2 | 2.5 | 14.4 | 11.9 | 15.1 | 26.7 |
| වෙනත් | 6.0 | 5.3 | (11.6) | 28.1 | 25.4 | (9.6) |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | 4.3 | 3.4 | (21.3) | 21.8 | 17.7 | (18.7) |
| **මුළු අපනයන** | 882.5 | 776.3 | (12.0) | 4,480.3 | 4,210.9 | (6.0) |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

### ආනයන ක්‍රියාකාරිත්වය

පසුගිය මාස 10 පුරා පැවැති පෙර වසරේ අදාළ මාසයට සාපේක්ෂව ආනයන වියදමෙහි අඩු වීමේ ප්‍රවණතාවය වෙනස් කරමින්, 2015 මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,585 ක් වූ ආනයන වියදම, 2016 මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,590 ක් දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් වර්ධනය විය. පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයනයන්හි අඩු වීමක් වාර්තා වුවද, ආයෝජන භාණ්ඩ ආනයන වියදම කැපීපෙනෙන ලෙස ඉහළ යෑම මෙම වර්ධනය සඳහා විශාල ලෙස දායක විය. 2016 මැයි මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම, සියලුම උප කාණ්ඩවල වර්ධනයන් පෙන්නුම් කරමින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මීට අමතරව, ප්‍රධාන වශයෙන් රෙදි වර්ග සහ කෙඳි වර්ග ආනයනවල වාර්තා වූ සැලකිය යුතු වැඩි වීම හේතුවෙන් මාසය තුළ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම වර්ධනය විය. තවද, 2016 මැයි මාසයේ දී

රත්‍රං ආනයනය ඉතා විශාල ලෙස වර්ධනය විය. එසේම, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම් ද මාසය තුළ දී කැපීපෙනෙන ලෙස වර්ධනය විය. කෙසේ වුවද, 2016 මැයි මාසයේ දී ඉන්ධන ආනයන වියදම විශාල ලෙස අඩු වූ අතර, ගල් අඟුරු සහ පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිතවල ආනයන පරිමාවන් කැපීපෙනෙන ලෙස වර්ධනය වුවද, බොරතෙල්, පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත සහ ගල් අඟුරුවල සාමාන්‍ය ආනයන මිල ගණන් සැලකිය යුතු ලෙස අඩු වීම මේ සඳහා හේතු විය. බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2015 මැයි මාසයේ වාර්තා වූ එ.ජ. ඩොලර් 63.09 ට සාපේක්ෂව 2016 මැයි මාසයේ දී එ.ජ. ඩොලර් 48.84 ක් දක්වා පහත වැටුණ ද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි තෙල් මිල ගණන් වර්ධනය වීම පිළිබිඹු කරමින් එය 2016 අප්‍රේල් මාසයේ දී පැවැති එ.ජ. ඩොලර් 44.05 ට සාපේක්ෂව ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් 2016 අයවැය මගින් වාහන ආනයනය සඳහා පැනවූ බදු ඉහළ දැමීමෙහි බලපෑම පෙන්නුම් කරමින් පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යටතෙහි වර්ග කර ඇති පෞද්ගලික රථවාහන සහ ප්‍රවාහන උපකරණ ආනයන වියදම් විශාල ලෙස පහත වැටුණු අතර, මෝටර් කාර්, දෙමුහුන් විද්‍යුත් වාහන සහ විශේෂයෙන්ම, ත්‍රී රෝද රථ සහ වාණිජ කටයුතු සඳහා භාවිතා කරන රථ වාහන ආනයන අඩු වීම මේ සඳහා හේතු විය. මීට අමතරව, මූල ලෝහ, සහල් සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම් ද 2016 මැයි මාසයේ දී සැලකිය යුතු ලෙස අඩු විය.


2016 පළමු මාස පහ තුළ දී සමුච්චිත ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 7,645 ක් දක්වා සියයට 2.8 කින් අඩු වූ අතර, ඉන්ධන, ප්‍රවාහන උපකරණ සහ සහල් ආනයනවල වාර්තා වූ අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2016 පළමු මාස පහ තුළ දී චීනය, ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ප්‍රධාන ආනයන ප්‍රභවයන් ලෙස පැවැති අතර, එම රටවලින් සිදු කළ ආනයන මුළු ආනයනවලින් සියයට 56 ක් පමණ විය.

# සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2015 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2016 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | 348.8 | 328.1 | (5.9) | 1,916.1 | 1,753.6 | (8.5) |
| ආහාර හා පාන වර්ග | 131.9 | 121.5 | (7.9) | 743.8 | 638.3 | (14.2) |
| කිරි නිෂ්පාදිත | 16.0 | 23.0 | 43.7 | 96.6 | 97.1 | 0.5 |
| මුහුදු ආහාර | 15.2 | 20.6 | 35.4 | 73.1 | 98.7 | 35.0 |
| සීනි හා රසකැවිලි | 17.4 | 14.3 | (17.8) | 123.2 | 108.7 | (11.8) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 20.5 | 2.3 | (88.8) | 128.7 | 9.2 | (92.8) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 62.8 | 61.3 | (2.5) | 322.2 | 324.7 | 0.8 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 216.8 | 206.7 | (4.7) | 1,172.3 | 1,115.3 | (4.9) |
| වාහන | 93.0 | 63.5 | (31.7) | 477.9 | 362.4 | (24.2) |
| ගෘහ උපකරණ | 12.3 | 20.1 | 62.8 | 86.8 | 113.5 | 30.9 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 111.5 | 123.0 | 10.3 | 607.6 | 639.4 | 5.2 |
| **2. අන්තර් භාණ්ඩ** | 889.2 | 851.4 | (4.2) | 4,042.3 | 3,870.7 | (4.2) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 205.2 | 234.6 | 14.3 | 974.1 | 1,131.3 | 16.1 |
| ඉන්ධන | 264.3 | 187.1 | (29.2) | 1,186.0 | 873.6 | (26.3) |
| දියමන්ති හා අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 19.7 | 49.0 | 148.5 | 101.1 | 168.8 | 66.9 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 18.8 | 43.6 | 131.9 | 97.7 | 123.3 | 26.2 |
| මූල ලෝහ | 49.3 | 28.3 | (42.7) | 210.2 | 133.7 | (36.4) |
| වෙනත් | 331.8 | 308.9 | (6.9) | 1,473.0 | 1,439.9 | (2.2) |
| **3. ආයෝජන භාණ්ඩ** | 345.8 | 408.8 | 18.2 | 1,900.7 | 2,016.7 | 6.1 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 174.1 | 222.0 | 27.5 | 950.1 | 1,147.2 | 20.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 100.0 | 137.5 | 37.5 | 509.0 | 622.8 | 22.4 |
| ප්‍රවාහන උපකරණ | 71.6 | 49.0 | (31.5) | 439.5 | 244.1 | (44.5) |
| වෙනත් | 0.1 | 0.3 | 123.6 | 2.1 | 2.6 | 19.3 |
| **4. වර්ග නොකළ ආනයන** | 1.6 | 1.4 | (12.7) | 9.0 | 4.3 | (52.6) |
| **මුළු ආනයන** | 1,585.5 | 1,589.8 | 0.3 | 7,868.0 | 7,645.2 | (2.8) |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය**




### වෙළඳ ශේෂය

2016 මැයි මාසයේ දී වෙළඳ ගිණුමෙහි හිඟය, 2015 මැයි මාසයේ පැවැති එ.ජ. ඩොලර් මිලියන 703 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 814 ක් දක්වා පුළුල් විය. තවද, 2016 පළමු මාස පහ තුළ දී සමුච්චිත වෙළඳ හිඟය ද 2015 අනුරූප කාලපරිච්ඡේදයෙහි වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,388 හි සිට එ.ජ. ඩොලර් මිලියන 3,434 ක් දක්වා වර්ධනය විය.

### සංචාරක ඉපැයීම්

2016 ජුනි මාසයේ දී 118,038 ක පැමිණීම් සංඛ්‍යාවක් සමඟින් සංචාරක පැමිණීම් සියයට 2.2 ක සුළු වර්ධනයක් වාර්තා කළේය. රුසියාව, බෙල්ජියම, නෝර්වේ සහ මාලදිවයින වෙතින් වූ සංචාරක පැමිණීම්හි සිදු වූ කැපීපෙනෙන අඩු වීම මෙම අඩු වර්ධනය සඳහා මූලිකවම හේතු විය. කෙසේ නමුත්, 2016 වසරේ පළමු මාස හය තුළ දී සමුච්චිත සංචාරක පැමිණීම් 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 964,267 දක්වා සියයට 16.2 කින් වැඩි විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය 2016 වසරේ ජුනි මාසය දක්වා සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර, කාලපරිච්ඡේදය තුළ දී වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 52.6 කට දායක විය. 2016 වසරේ පළමු මාස හය තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම්[1] 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,375.7 සමඟ සැසැඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,598.2 දක්වා ඉහළ ගියේය.

1 සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2016 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

### විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ

2016 මැයි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මගින් වූ ලැබීම් පෙර මාසයේ දී වාර්තා වූ සියයට 1.4 ක අඩු වීම හා සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 597.2 ක් දක්වා සියයට 11.1 කින් වැඩි විය. ඒ අනුව, 2016 වසරේ පළමු මාස පහ තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මගින් වූ සමුච්චිත ලැබීම් 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,968.6 දක්වා සියයට 5.9 කින් වැඩි විය.

### මූල්‍ය ලැබීම්

වසරේ පළමු මාස පහ තුළ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 37.3 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, එය ද්විතියික වෙළඳපොළ වෙතින් වූ එ.ජ. ඩොලර් මිලියන 38.6 ක ශුද්ධ ගෙවීම්වලින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 1.3 ක ලැබීම්වලින් සමන්විත විය. 2016 වසරේ පළමු මාස පහ තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ, 2015 අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 61.7 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 442.8 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2016 වසරේ පළමු මාස පහ තුළ දී රජය වෙත වූ දිගු කාලීන ණය 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 82.6 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 20.1 ක ශුද්ධ ගෙවීමක් විය.

### ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය

2016 වසරේ පළමු මාස පහ තුළ දී ගෙවුම් තුලනය 2015 අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,307.4 ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,142.3 ක හිඟයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

### ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතයේ හැසිරීම

2016 මැයි මස අග වනවිට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.6 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 5.6 ක් වූ අතර, මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 4.9 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.7 ක් විය.

2015 වසර අග සිට 2016 අගෝස්තු මස 8 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 1.1 කින් මධ්‍යස්ථව අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාත හැසිරීම මත පදනම්ව මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝවලට එරෙහිව සියයට 2.6 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 16.2 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 6.0 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 5.2 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.6 කින් ද අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 12.1 කින් අධිප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය(අ)**

| කාණ්ඩය | 2015 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2016 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 882.5 | 776.3 | -12.0 | 4,480.3 | 4,210.9 | -6.0 |
| ආනයන | 1,585.5 | 1,589.8 | 0.3 | 7,868.0 | 7,645.2 | -2.8 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය (-)) | -702.9 | -813.5 | 15.7 | -3,387.7 | -3,434.3 | 1.4 |
| සංචාරක ඉපැයීම් | 188.2(ආ) | 207.2 | 10.1 | 1,184.4(ආ) | 1,402.5 | 18.4 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 537.7 | 597.2 | 11.1 | 2,803.1 | 2,968.6(ආ) | 5.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 13.3 | -17.8 | -233.8 | 58.2 | -37.3 | -164.1 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 96.0 | 290.8 | 202.9 | 976.3 | 814.5 | -16.6 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 10.1 | 189.7 | 1,769.5 | 526.1 | 407.4 | -22.6 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | - | - | - |
| දිගුකාලීන ණය | 79.0 | 100.6 | 27.3 | 406.0 | 396.5 | -2.3 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 346.4 | 164.5 | -52.5 |

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.
(ඉ) දත්ත පවතිනුයේ වසරේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ද ඇතුළත් වේ.